(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 207.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1188/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත තිරිඟු පිටි පරිභෝජනය සහ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේදී තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය කවරේද;

(iv) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(v) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන සහ දේශීයව නිපදවනු ලබන තිරිඟුපිටි කිලෝග්‍රෑම් 1ක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු හා වක්‍ර) කවරේද යන්නත් එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ගා/අගුළුගල්ල කණිෂ්ඨ විද්‍යාලය වසා දමා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පාසල සතු විශාල භෞතික සම්පත් ප්‍රමාණයක් විනාශ වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල නැවත විවෘත නොකරන්නේ නම්, එය වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික රූපවාහිනිය සතු ක්‍රීඩා තරග පටිගත කළ කැසට් පට හෝ දෘඪ තැටි කාල්ටන් ක්‍රීඩා නාලිකාව (CSN) වෙත ලබා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දුන් පදනම කවරේද;

(iv) එම කැසට් පට ලබා ගැනීම වෙනුවෙන් කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේ නම්, එම ඉල්ලීම් කළ අයගේ විස්තර කවරේද;

(ii) එකී ඉල්ලුම් ලිපිය කුමක්ද;

(iii) ජාතික රූපවාහිනිය විසින් එකී කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමට බලය ලබා දුන් නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'11

4.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2345/'12

5\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ ආයතනය කුමක්ද;

(ii) එම ආයතනය විසින් ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ඉටු කරනු ලබන කාර්යභාරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට ක්‍රියාත්මක වන ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව;

(ii) ඒවායේ රැකවරණය ලබන ළමුන් සංඛ්‍යාව;

(iii) ඒවායේ සේවය කරන පාලිකාවන් හා සහායිකාවන් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2425/'12

6\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ විදුලිය නිපදවීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම විදුලි බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට තථ්‍ය වශයෙන්ම එකතු කරන විදුලි ඒකක ප්‍රමාණය කොපමණද;

(iii) එම බලාගාරයෙන් එක් විදුලි ඒකකයක් නිපදවීමට දිනකට වියදම කොපමණද;

(iv) විවෘත කිරීමෙන් පසුව නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය අක්‍රිය වූ වාර ගණන කොපමණද;

(v) අවසන් වරට එය අක්‍රිය වූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම විදුලි බලාගාරය සඳහා කළ වියදම නිරර්ථක වී ඇති බව පිළිගන්නේද;

(ii) එම ව්‍යාපෘතිය අසාර්ථක වීමට අදාළ වගකිවයුත්තන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඔවුන් සම්බන්ධයෙන් ගෙනඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2781/'12

7\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.05.01 දින යාපනයේ පැවති ඒකාබද්ධ විපක්ෂයේ මැයි රැළියේදී කොටි සංවිධානයට අයත් කොඩියක් යම් අයෙකු විසින් ප්‍රදර්ශනය කරන රූපරාමු ඇතුළත් ප්‍රවෘත්තියක් ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශය කළේද;

(ii) ස්වාධීන රූපවාහිනී සේවයට අයත් මාධ්‍යකරුවෙක් හෝ කණ්ඩායමක් විසින් එකී මැයි රැළිය රූගත කරනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, කොටි සංවිධානයට අයත් කොඩියක් ප්‍රදර්ශනය කිරීමේ දර්ශන ඇතුළත් වීඩියෝ පටය ස්වාධීන රූපවාහිනී සේවයට ලබා දුන් පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්වාධීන රූපවාහිනී සේවය විසින්,

(i) ඉහත වීඩියෝ පටයේ අව්‍යාජභාවය හෝ නිරවද්‍යභාවය තහවුරු කරගනු ලැබූ ආකාරය කවරේද;

(ii) ඉහත කී දර්ශන ඇතුළත් රූපරාමු විකාශය කරන ලද වාර ගණන කොපමණද;

(iii) එම දර්ශන විකාශය කරන ලද දින හා වේලාවන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1833/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු මාරුවීම් නොලැබ දැඩි කලකිරීමට පත් ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් සිටින බවත්;

(ii) එසේ කලකිරීමට පත්වීම එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය පිරිහීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට මාතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු වීම් ඉල්ලා සිටින දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති ගුරුවරුන්ට ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1934/'11

9.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබා ඇති ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ලාභය හෝ අලාභය ලැබීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේ අවස්ථාවේ සිට ඒවා අවසන් වශයෙන් භාවිතාකිරීම දක්වා ඒ මත පැනවෙන සියලුම බදු සහ ගාස්තු එකතුකිරීමෙන් පසු ලැබෙන සමස්ත ලාභය හෝ අලාභය කවරේද;

(ii) බදු එකතු කර ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීම මගින් රජය විසින් මෙතරම් විශාල අසාධාරණ ලාභයක් උපයා ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හෙජින් වංචාව හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ වන විට විදේශීය බැංකුවලට ගෙවීමට සිදුවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2123/'11

10\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(ii) එකී මුදල් ආයෝජනය කළ වර්ෂයන් කවරේද;

(iii) එකී ආයෝජනයන් සඳහා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එම මුදල් අයෝජනය කිරීමට තීරණය කළ අය කවුරුන්ද;

(v) ඒ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමතිය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2348/'12

11\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් නිර්දේශකර ඇති පරිදි ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක රැකවරණය ලැබිය හැකි දරුවකුගේ උපරිම හා අවම වයස් සීමාවන් කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාව තුළ ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානවල ළමුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් වාර්තා වී ඇති චෝදනා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2427/'12

12\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රධාන ආපනශාලාව බදු දී ඇති ආයතනය කවරේද;

(ii) එම ආයතනයට රෝහල් ආපනශාලාව බදු දුන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ආයතනය යටතේ පාලනය වන රෝහල් ආපනශාලාව මගින් සේවකයන්ට හා රෝගීන්ට සහන ගාස්තු මත ආහාරපාන සපයන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආයතනය මගින් පාන්පිටි නිෂ්පාදනවලට අමතරව වෙනත් ආහාර ලබාදෙන්නේද;

(ii) දියවැඩියා රෝගීන් සඳහා එම ආපනශාලාව මගින් ලබාදෙන පාන්පිටි නොවන ආහාර කවරේද;

(iii) එම ආපනශාලාව මගින් දියවැඩියා රෝගීන් හා අනෙකුත් රෝගීන් සඳහා පාන්පිටි නොවන ආහාර ලබාදීම ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1834/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි, කුරුවිට පොලිස් ස්ථානයේ අලුතින් ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් වී වර්ෂ හතරක් ගතවී ඇතත් එය ප්‍රයෝජනයට නොගෙන වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඉදිකිරීම් අවසන්ව තිබියදීත් එම නව ගොඩනැගිල්ල විවෘත නොකිරීමට හේතු කවරේද;

(iii) එම නව ගොඩනැගිල්ලේ කුරුවිට පොලිසියේ රාජකාරී කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1935/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ මැයි සිට ජූලි දක්වා වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවට බාල තත්ත්වයේ පෙට්‍රල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) අමාත්‍යාංශය බාල තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී සිදුවී ඇති වංචාවලින් බැහැර වන්නේ කෙසේද;

(iii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා අලාභහානි විඳීමට සිදු වූ පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීමෙන් ඇති වූ අලාභ හානි සම්බන්ධව පැමිණිලි කළ පාරිභෝගිකයන්ගේ නම් කවරේද;

(v) අලාභ හානි විඳීමට සිදු වූ එක් එක් පාරිභෝගිකයාට වන්දි වශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(vi) තත්ත්වයෙන් බාල පෙට්‍රල් හේතුවෙන් හානි වූ යන්ත්‍රෝපකරණ සහිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉන්ධන පිරවුම්හල්වලට වන්දි ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තත්ත්වයෙන් බාල පෙට්‍රල් පිළිබඳ වංචාව ජනතාවට හෙළිකළ පාර්ශ්වයන් වෙත ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2124/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහා බ්‍රිතාන්‍යය විසින් ලබා දුන් යකඩ පාලම් ව්‍යාපෘතිය යටතේ ලංකාව පුරා ඉදි කළ යකඩ පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම පාලම් ඉදිකිරීම සඳහා බ්‍රිතාන්‍යය ලබා දුන් මුදල කොපමණද;

(iv) එම එක් එක් පාලමේ දිග, පළල, ඇස්තමේන්තුගත මුදල සහ ඉදිකිරීම් පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එක් එක් පාලම සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඇස්තමේන්තුගත මුදලට වඩා වියදම් ඉක්මවා යාමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. අ. භා. 4.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3), 14 සහ 20 වැනි වගන්ති යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 ජූනි 27 දිනැති අංක 1764/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

දිවි නැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*10.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

11.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

කාසිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

2203/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු නොලබන, පසුගිය වර්ෂ දහය තුළදී පිහිටුවනු ලැබූ, රජයට අයත් සියලුම සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සඳහන් සමාගම් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, එම සමාගම් අධීක්ෂණය කරනු ලබන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දහයක කාලය තුළ,

(i) රජය විසින් කිසියම් බද්දක් අයකර ගෙන ඇති හෝ රජය වෙත ලාභාංශ ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) රජය විසින් මුදල් ගෙවන ලද, එහෙත් රජය වෙත කිසිදු මුදලක් ආපසු ලබාදී නොමැති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය වෙත රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන සමස්තයක් ලෙස, එක් එක් වර්ෂය සඳහා ලාභයක් හෝ අලාභයක් ලැබුවේද;

(v) එම එක් එක් ආයතනයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කවරේද; සහ

(vi) රජය විසින් එම එක් එක් ආයතනය සඳහා යොදවන ලද සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය කවරේද;

යන්නත් ඉහත (ආ) (i) හි සඳහන් කළ සමාගම්වලට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2302/'12

2.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව, දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අවසන් වරට සිදුකරන ලද ගුරු වැටුප් සංශෝධනය අනුව ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය සඳහා හිමි මූලික මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රජයේ ගුරුවරුන්ට මාසික වැටුපට අමතරව හිමිවන වරප්‍රසාද හා දීමනා ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2303/'12

3.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළ ඩෙංගු වැළඳීම, රිය අනතුරු, සියදිවි නසා ගැනීම, ආහාර විෂවීම, කායික හෝ මානසික අතවරයන්ට ලක්වීම යන හේතු මත රෝහල්ගත කළ / මිය ගිය පාසල් ළමුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂය තුළ විවිධ වරදවල් යටතේ චෝදනා ලබා ළමා අධිකරණයට යොමු කර ඇති පාසල් සිසුන් සංඛ්‍යාව, ඔවුන් අයත්වන වයස් කාණ්ඩය හා පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2461/'12

4\. ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඞ්ඩාලච්චේන 14, කොමන් පාරේ, අංක 4/5 දරන ස්ථානයේ පදිංචි එම්. ඒ. අබාජුල්ෆාන් මහතා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට 2006.06.01 දින පෙනී සිට ඇති බවත්;

(ii) සියලු සුදුසුකම් සපුරා සිටියත් ඉහත තනතුරට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මෙතෙක් ඔහුගේ නම නිර්දේශකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කාරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද (HRC/2775/09) නිර්දේශය ක්‍රියාවට නංවමින් (අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව) ඔහුට හිමිවිය යුතු උසස්වීම ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2462/'12

5\. ගරු මොහමඩ් අස්ලම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරණ, දොඩම්ගොල්ලේ, අංක 233/1 දරන ලිපිනයේ පදිංචි, කුරුගොඩ මුහන්දිරම්ලාගෙදර නූර් මුහම්මද් සෙයියද් මුහම්මද් මහතා විසින් නුවරඑළිය මහ නගර සභාව සතු "කාර්ගිල්ස් පිටිය" වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමරයක් බද්දට ලබා ගැනීම සඳහා වර්ෂ 1993.01.04 දින රුපියල් ලක්ෂයක මුදලක් සහ 2002.09.25 දින රුපියල් අනූදහසක මුදලක් තැන්පත් කරනු ලැබුවත් මෙතෙක් ඒ මහතාට කඩ කාමරය ලබාදී නොමැති බවත්;

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනයකට අනුව සෙයියද් මුහම්මද් මහතාට අදාළ කඩ කාමරය හිමිවිය යුතු බවට ලබා දුන් නිර්දේශය (HRC/K/429/06/11) එම පළාත් පාලන ආයතනය විසින් පැහැර හරිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත නිර්දේශය ක්‍රියාවට නැංවීමෙන් වැළකී අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය උල්ලංඝනය කරමින් සිටින නුවරඑළිය මහ නගර සභාවේ වගකිව යුත්තන්ට එරෙහිව අපක්ෂපාති පරීක්ෂණයක් පැවැත්වීමටත්, සෙයියද් මුහම්මද් මහතාට සාධාරණය ඉෂ්ට කිරීමටත් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?